**මහනුවර මහා නගර සභාව**

***මහනුවර මහා නගර සභාව සඳහා ශ්‍රම මිල දී ගැනීමේ පදනම මත***
***මාංශ පරීක්ෂණාගාර සහායක සේවය ලබාගැනීම***

මහනුවර මහා නගර සභාවේ සේවා අවශ්‍යතාවය මත ශ්‍රම මිල දී ගැනීමේ පදනම මත මාංශ පරීක්ෂණාගාර සහායක සේවය ලබා ගැනීම සඳහා පහත සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි සපයනු ලබන සේවාවේ නාමය සඳහන් කර 2026.08.14 දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, මහනුවර මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය යුතුය.

| | | | |
|---|---|---|---|
| 1. | තනතුරු සංඛ්‍යාව | : | තනතුරු 02 |
| 2. | වයස | : | සියලුම අයදුම්කරුවන් අයදුම්පත් ඉදිරිපත් කරන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. |
| 3. | දීමනාව | : | දෛනික දීමනාව රු. 2000/- කි. (මාසයකට අවම දින 25ක් රාජකාරි කළ යුතුය) |
| 4. | අධ්‍යාපන සුදුසුකම් | : | 5 ශ්‍රේණිය සමත්ව තිබීම |
| 5. | වෘත්තීය සුදුසුකම් | : | ක්ෂේත්‍රයට අදාළ පළපුරුද්ද |
| 6. | තෝරා ගැනීමේ ක්‍රමය | : | අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයවළුන් අතරින් බඳවා ගැනීමට අවශ්‍ය මූලික සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, අවශ්‍ය සියලුම සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව නිසි සුදුසුකම් සහිත අයදුම්කරුවන් තෝරාගෙන ඔවුන් ලබාගත් ලකුණු ප්‍රමුඛතාවය අනුව බඳවා ගනු ලැබේ.<br><br>සේවාව සපයා ගැනීමට තෝරාගනු ලබන නිලධාරින් පහත කොන්දේසිවලට යටත්ව සේවයේ යොදවා ගැනීම සිදු කරනු ලැබේ.<br><br>1. දිනකට අවම පැය 09 ක කාලයක් සේවාව සැපයිය යුතුය.<br>2. පූර්ණ කාලීනව රාජකාරින්හි නියැලිය යුතුය.<br>3. සේවා සැපයීමට අදාළ අවු: 1 ක කාල සීමාවක් සඳහා සේවා ගිවිසුමකට ඇතුළත් විය යුතු අතර සේවා අවශ්‍යතාවය මත මෙම කාල සීමාව දීර්ඝ කරනු ලැබේ. |
| 7. | වෙනත් සුදුසුකම් | : | ▪ කායික සුදුසුකම් : තනතුරේ රාජකාරි ඉටු කිරීමට සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.<br>▪ අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය. මහනුවර නගර සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු විය යුතුය. |

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරී අබේසිංහ,
නාගරික කොමසාරිස්,
මහනුවර මහා නගර සභාව.

2026 ජූලි මස 31 දින.